# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

2017.09.07

කබීර් හෂීම් මැතිතුමා,
මහ ලේකම්,
එක්සත් ජාතික පක්ෂය,
"සිරිකොත"
නො. 400, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ

ගරු ලේකම්තුමනි,

**ඉදිරි පළාත් පාලන මැතිවරණය සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමේදී නිර්ණායක අනුගමනය කිරීම.**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පළාත් පාලන ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමේදී යම් නිර්ණායක ප්‍රමාණයක් සලකා බැලීමට තීන්දු කොට ඇති බවත් එහි අරමුණ සමාජ විරෝධී පුද්ගලයින් දේශපාලන ක්‍රියාවලියට පිවිසීම වලක්වා වඩා යහපත් දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් ආරම්භයක් ගැනීම බවත් 2017.08.06 දින සිරිකොත එක්සත් ජාතික පක්ෂ මූලස්ථානයේදී පැවැති මාධ්‍ය හමුවකදී ඔබතුමා ප්‍රකාශ කොට තිබුනි. එහිදී වැඩි දුරටත් මාධ්‍ය වාර්තා කොට තිබුනේ අදාල නිර්ණායක ඉදිරි කාලසීමාවේදී මාධ්‍ය හරහා සමාජ ගත කිරීමට කටයුතු කරනු ලබන බවයි.

වගකිව යුතු සිවිල් සංවිධානයක් මෙන්ම මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙසද මෙවැනි ඉදිරිගාමී ප්‍රවේශයක් කරා යොමුවීම පිළිබඳව අපගේ ප්‍රණාමය පලකර සිටිමු. 2015 මාර්තු 12 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සියළු ප්‍රධාන දේශපාලන පක්ෂ නායකයින් මාර්තු 12 නිර්ණායක වලට එකගතාවය පලකරමින් අත්සන් කරන ලද අතර එකී අනුකූලතාවය ප්‍රායෝගික තලයේ ක්‍රියාකාරීත්වයක් කරා යොමුවීම ශ්‍රී ලංකා දේශපාලන සංස්කෘතියේ සුවිශේෂී හැරවුම් ලක්ෂයක් බව අප විශ්වාස කරමු.

බොහෝවිට දේශපාලන පක්ෂ මැතිවරණ ජයග්‍රහණය පමණක් ඉලක්ක කර ගනිමින් විවිධ සමාජ විරෝධී, දූෂිත පුද්ගලයින්ට නාම යෝජනා ලබාදීම සුලභ තත්වයක් බව අමුතුවෙන් සඳහන් කල යුතු නොවේ. ඒ වෙනුවට විධිමත් නිර්ණායකයන්ට අනුකූලව සුදුසු පුද්ගලයින්ට පමණක් නාම යෝජනා ලබා දෙන්නේ නම් අතීතයේ පැවති දේශපාලකයින් සඳහා තිබූ ගරු කටයුතු ස්වභාවය ළගාකර ගැනීම අසීරු ඉලක්කයක් නොවනවා සේම රටක් ලෙස වර්ණවත් අනාගතයකට ප්‍රවේශයක් ගැනීම පහසු කටයුත්තක් වනු ඇත.

යහපත් දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් ගනු ලබන මෙකී පියවර පිළිබඳව ප්‍රණාමය පලකර සිටින අතර ඔබ පක්ෂය අනුගමනය කිරීමට අපේක්ෂා කරනු ලබන නිර්ණායක කවරේද යන්න අපවද දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් අතියයින් සතුටු වෙමු.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk

Scanned by CamScanner